සීමාන්විතයි

විධායක ජෙනරල් ශාඛාව
යුද්ධ හමුදා මූලස්ථානය
කොළඹ

විජෙශා/නිති/ගිවිසුම්/06/01(16)

සියළු ස්ථාන (නාවික/ගුවන් හැර)

2015 නොවැම්බර් මස 4 දින

<u>අවබෝධතා ගිවිසුම් ගතවීම සබැඳිව උපදෙස් ලබාදීම</u>

යොමුව:

අ. AG/LEG/A/06/01 (15) හා 2012.11.01 දිනැති සියළු ස්ථාන අමතා ඇති මෙම ශාඛා උපදෙස් ලිපිය. (ඡායාස්ථ පිටපතක් අමුණා ඇත)

1. ඔබ ස්ථානයන්හි විවිධ ඉදිකිරීම්/සපයාගැනීම් වෙනුවෙන් සිවිල් ආයතනයන් සමග අවබෝධතා ගිවිසුම් ගතවීම් සිදුකල යුතු ආකාරය පිළිබඳ පැහැදිලි උපදෙස් මෙම ශාඛා යොමුගත ලිපිය මගින් සියළු ස්ථාන දැනුවත් කරන ලදී.

2. එහෙත් එම ලිපියේ උපදෙස් පරිදි ක්‍රියා නොකරන යම් යුහ ස්ථානයන්හි ආයතන ප්‍රධානීන්ගේ අභිමතය පරිදි යුද්ධ හමුදා පරිබාහිර ආයතන සමග අවබෝධතා ගිවිසුම් ඇති කරගැනීමෙන් අනතුරුව යුද්ධ හමුදාව වෙත අවාසිදායක නීති සමූහයකට යටත්ව කටයුතු කිරීමට සිදුවීමෙන් පසු එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් අපේක්ෂා කරන බැව් යුද්ධ හමුදාධිපතිගේ නිරීක්ෂණයට ලක්වී ඇත.

3. කරුණු එසේ හෙයින් මින් ඉදිරියේදී ඔබ ස්ථානයන් වෙතින් යම් ආයතනයන්/සමාගම් සමග අවබෝධතා ගිවිසුම් ගතවන්නේ නම් යොමුගත ලිපියේ සඳහන් උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු බැව් සියළුම ආයතන ප්‍රධානීන්ගේ පූර්ණ අවධානයට ලක්කරන අතර, යම් හෙයකින් අදාල ලිපියේ උපදෙස් වලට පටහැනිව මෙම මූලස්ථානයේ අනුදැනුමකින් තොරව ගිවිසුම් ගතවී නිරීක්ෂණය වුවහොත් ආයතන ප්‍රධානීන් විසින් ඒ සඳහා වගකිව යුතු බැව් යුද්ධ හමුදාධිපති විසින් තරයේ අවධාරණය කර ඇත.

4. මෙම ලිපිය ලද බවත් එහි සඳහන් උපදෙස් පරිදි ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කරන බවට සනාථ කරන්න.

එම් හතුරුසිංහ ආර්එස්පී එන්ඩීසී අයිජී
මේජර් ජෙනරල්
විධායක ජෙනරල්

සීමාන්විතයි